# සිංහල අවුරුද්ද සහ ථෙරවාදය

තව නොබෝ දිනකින් තවත් සිංහල අවුරුද්දක් උදාවෙයි. දැනට දශක කිහිපයකට පෙර නම් බක් මාසයේ උදාවූයේ අවුරුද්ද ය. එකල ජනවාරි මස උදා වූ ක්‍රිස්තු වර්ෂයට සිංහලයන් කිව්වේ ජනේරුව කියා ය. එහෙත් මුළු ලෝකයම ක්‍රිස්තියානි සංස්කෘතියට ගැනීමට කැසකවන බටහිර ක්‍රිස්තියානි නූතනත්වය හෙවත් යටත්විජිතවාදය හෙවත් අද දවසේ යොදාගන්නා වචනයක් අනුව නම් ගෝලීයකරණය විසින් ඒ සියල්ල කණපිට හරවනු ලැබ ඇත. අද ජනවාරි මස අවුරුද්ද උදාවන අතර බක්මහේ දී සිංහල අවුරුද්ද උදාවෙයි. බක්මස උදාවන අවුරුද්දට සිංහල අවුරුද්ද යන්න ද පඬියන් වූ ප්‍රබුද්ධයන් අතර ගිලිහී යමින් පවතියි. දහනමවැනි සියවසේ ඉංගිරිසිහු අවුරුද්ද සිංහල හා හින්දු අවුරුද්ද යැයි නම් කළහ. අද බටහිරයන්ගෙන් පඩි ලබන රාජ්‍ය නොවන උගත්තු සහ වෙනත් අය එයට සිංහල හා දෙමළ අවුරුද්ද යැයි කියති. ප්‍රබුද්ධත්වය හා පඬිකම වැඩිවූවෝ එයට සිංහල හා ද්‍රවිඩ අවුරුද්ද යැයි කියති.

බක් මහේ අවුරුද්දට සිංහල දෙමළ හෝ ද්‍රවිඩ යැයි නොකියා සිංහල අවුරුද්ද යැයි කීමේ වරදක් නැත. එහෙත් ජනේරුවට විශේෂණයකින් තොරව අවුරුද්ද යැයි නො කිවයුතු ය. ජනේරුවට කිවයුත්තේ බටහිර ක්‍රිස්තියානි අවුරුද්ද කියා ය. විශේෂණයකින් තොරව අවුරුද්ද යැයි කී විගස එය මුළු ලෝකයේ ම හා ඒ අනුව අපේ ද අවුරුද්ද යැයි කියැවෙයි. බටහිරයන් තමන්ගෙ අවුරුද්ද මුළු ලෝකයේම අවුරුද්ද බවට පත්කිරීමට ගන්නා උත්සාහය හේතුවෙන් ඒ එසේ වෙයි. අප ඒ උත්සාහය පරාජය කළයුතු ය.

මේ අතර තවත් පිරිසක් කිසිම විචාර බුද්ධියකින් තොරව සිංහල අවුරුද්ද උදාවන්නේ දෙවුන්දර තුඩුවට හෝ මන්නාරමට හෝ වෙනත් නගරයකට ඉර මුදුන්වන දවසේ දී යැයි කියති. අවුරුදු ගණනක් තිස්සේ මේ මතය වැරදි බව අප පෙන්වා දී ඇතත් විචාර බුද්ධියක් නැති මොවුහු තම මතයේ දිගින් දිගටම එල්බගෙන සිටිති. මෙවැනි අශාස්ත්‍රීය පුද්ගලයන් නිසා ජාතික මතවාදවලට මහත් අවැඩක් සිදුවෙයි. මේ මතය අඩුම තරමින් හේතු දෙකක් නිසා වැරදි වෙයි. පළමුවෙන් ම බක් මස දහහතරවැනිදා මේ නගරවලට හිරු මුදුන් නො වෙයි. මේ අවිචාර පුද්ගලයන් ඒ බව නොපිළිගන්නේ නම් කළයුත්තේ එදින ඒ නගරවලට ගොස් ඇද නැති කෝටුවක් සිරස් ව සිටුවා එහි සෙවනැල්ල නැති නොවන බව දැනගැනීම පමණකි. අවුරුදු දෙකකට තුනකට වතාවක් කෙරෙන මේ වැරදි ප්‍රචාරය නැවැත්විය යුතු කාලය එළඹී ඇත.

මේ අවිචාර පුද්ගලයන්ගේ අවචාර බුද්ධියට ගෝචර නොවන තවත් කරුණක් වෙයි. එනම් අවුරුද්දෙන් අවුරුද්ද ක්‍රිස්තු වර්ෂයට සාපේක්ෂව ශක වර්ෂය ඉදිරියට යෑම ය. රොබට් නොක්ස් මෙරටට පැමිණි දිනවල සිංහල අවුරුද්ද උදාවූයේ අප්‍රියෙල් දහතුන හෝ දහහතර හෝ නොව ඊට දින කිහිපයකට කලින් ය. (මේ පිළිබඳ විස්තර සිංහල අවුරුද්ද පොතෙහි සඳහන් වෙයි.) ක්‍රිස්තුවර්ෂයට අනුව මන්නාරමට හිරු මේ අවුරුද්දේ මුදුන්වන දවස අවුරුදු දෙසියයකට හෝ තුන්සියයකට හෝ පෙර උදාවූ දිනයෙන් වෙනස් නො වෙයි. ඒ එසේ නම් සිංහල අවුරුද්ද උදාවන දිනයේ දී සැමදාමත් හිරු මන්නාරමට උදා විය නො හැකි ය. එසේ නම් මන්නාරමට හිරු මුදුන්වන දිනය සිංහල අවුරුද්ද උදාවන දිනය ලෙස සැලකීම කෙතරම් අමනෝඥ ක්‍රියාවක් ද?

සිංහල හින්දු අවුරුද්ද යන්න ව්‍යවහාරයට පත්කෙරුවෝ ඉංගිරිසිහු ය. ඔවුහු සිංහලයන් අතර තිබූ අවුරුද්දට හින්දු යන කැල්ල ද එකතුකෙළේ නිවාඩු පිළිබඳ සමබරතාවක් තබාගැනීමට යැයි කතාවක් වෙයි. ඒ කෙසේ වෙතත් අපේ කලාපයේ ඉතිහාසය ලිවීම ආරම්භකරමින් මහා අවුලක්කිරීමට නම් ඉංගිරිසිහු සමත්වූහ. සිංහලයන් තමන්ගේ ඉතිහාසය වංශකතාවල ලියා නොතබන්නට අපට මේ තිබෙන ටිකත් නැතිවීමට තිබූ ඉඩකඩ විශාල ය. ඉංගිරිසින් විසින් පුහුණු කරනු ලැබූ ලිබරල් ඉතිහාසඥයෝ හා යුරෝපයෙන් ම පුහුණු කරනු ලැබූ කසිකබල් මාක්ස්වාදී ඉතිහාසඥයෝ ඒ මගම ගොස් මේ කලාපයේ ඉතිහාසය තවත් අවුල් කළහ. අද අප අත්විඳින්නේ එසේ ඉතිහාසය අවුල්කිරීමේ විපාක ය.

අපේ කලාපයේ ඉතිහාසය යනුවෙන් මෙහි දී අදහස් කෙරෙන්නේ මූලික වශයෙන් ලංකාවේ හා භාරතයේ ඉතිහාසයත් ඒ ආශ්‍රිතව ඇති වූ අග්නිදිග ආසියාවේ ඉතිහාසයත් ය. ලංකාවේ හා භාරතයේ ඉතිහාසය එක් කලාපයක ඉතිහාසයක් ලෙස හැදෑරීමේ ප්‍රවණතාවක් තවමත් නැත. එබැවින් මෙරට බොහෝ ඉතිහාසඥයන් මෙන් ම පුරාවිද්‍යාඥයන් ද

© Prof. Nalin De Silva

ලංකාවට සැම දෙයක් ම එක්කෝ උතුරු ඉන්දියාවෙන් නැත්නම් දකුණු ඉන්දියාවෙන් ලැබුණු දේ ලෙස සැලකීමට පුරුදු වී ඇත. අනෙක් අතට තවත් සමහරුන්ට භාරතයට සියල්ල ලැබී ඇත්තේ ලංකාවෙන් ය. මේ මත දෙකම බැහැර කළ යුතු බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

ලංකාවේ ඉතිහාසය හා භාරතයේ ඉතිහාසය අතර සමානකම් මෙන් ම අසමානකම් ද වෙයි. ඉන් ප්‍රධාන ම අසමානකම වන්නේ බටහිරයන් පැමිණීමට අවුරුදු දෙදහසකට පමණ පෙර භාරතයේ ඉතිහාසය වංශ ඉතිහාසයක් වීමත් සිංහලයන්ගෙ ඉතිහාසය ජාතියක ඉතිහාසය වීමත් ය. භාරතයේ උතුරේ වේවා දකුණේ වේවා අපට හමුවන්නේ රාජ වංශවල ඉතිහාසය මිස ගෝත්‍රයක හෝ ජාතියක හෝ ඉතිහාසය නො වෙයි. මෞර්ය වංශය වේවා එයට පෙර ශාක්‍ය කෝලිය වැනි වංශ වේවා ලිච්ඡවීන් වේවා දකුණේ ශක වංශය වේවා ශාතවාහනයන් වේවා පල්ලවයන් වේවා සොළී පාණ්ඩ්‍ය චේර මේ කොයි කවුරුන් හෝ වේවා ඒ සියල්ල වංශ මිස ජාතියක් හෝ ගෝත්‍රයක් හෝ නො වෙයි. මේ වංශ ඇතැම් ගෝත්‍රවලින් කොටසක් හා ගෝත්‍ර කිහිපයක කොටස් හෝ පාලනය කර ඇත.

උදාහරණයක් වශයෙන් ගත්කල අපේ මාර්තෘකාවට අදාළවන ශක වාංශිකයන් භාරතයේ උදේනි නුවර හෝ ඒ ආසන්නයේ හෝ සිට සංක්‍රමණය වී අද ආන්ද්‍ර නමින් හැඳින්වෙන ප්‍රාන්තයේ කොටසක් හා ඇතැම්විට වෙනත් ප්‍රාන්තයක ද කොටසක් පාලනය කළ වංශයක් විය. මේ පිරිස මෙන් ම අනෙක් වංශ ද යම් යම් කාල පරිච්ඡෙදවල භාරතයේ කොටස් පාලනය කළහ. ඔවුන් කිසිවකුටවත් භාරතයේ ජාතියක් නොව ගෝත්‍රයක් වශයෙන් හෝ පාලනයක් ගෙන යෑමට නො හැකි විය. එබැවින් භාරතය ජාතියක් ලෙස එකතුකිරීමේ තැතක් ද නොවිණි. මේ තත්ත්වය ලංකාවේ ඇති නොවිණි. ශාරතයෙන් වෙන් වූ දිවයිනක් ලෙස පැවතීම හේතුකොටගෙන අපට ජාතියක් ලෙස වර්ධනය වීමේ අවස්ථාව පණ්ඩුකාභය කාලයේ දී එළඹිණි. පණ්ඩුකාභය රජතුමා එතෙක් පැවති සිංහ වංශිකයන්ගේ තවත් ගොත්‍රිකයන්ගෙ පාලන අවසන්කර ඒ සියල්ල එකතුකර ජාතියක් ලෙස සිංහලයන් පාලනය කෙළේ ය. භාරතයේ වංශ හා ලංකාවේ ජාතිය අතර කතාව අපි පසු දවසක කතා කරමු. අද අපට වැදගත් වන්නේ ශක රජවරුන්ගෙන් භාරතයේ ඇතැම් කොටස්වලට හා අග්නිදිග ආසියාවේ ඇතැම් රටවලට ලැබිණි යැයි සිතිය හැකි සංක්‍රාන්ති උත්සවය ගැන යමක් සඳහන්කිරීම ය.

බක්මහ උළෙල දකුණු ඉන්දියාවේ දෙමළ හින්දු ජනයා අතරද ඇතැයි කීමට වෙර දරන බොරු සාම බෝනික්කෝ එය පට්ටපල් බොරුවක් බව නොදනිති. කවුරුන් හෝ නිර්මානය කළ කෙබරයක් පුනරුච්චාරණයකිරීම මේ ගිරා පෝතකයන්ගෙ සිරිත ය. දකුණු ඉන්දියාවේ තමිල්නාඩුවේ දෙමළ හින්දු ජනයා අතර උත්සවශ්‍රීයෙන් පැවැත්වෙන බක්මහ උළෙලක් නැත. එහෙත් සංක්‍රාන්ති උත්සවයක් පැවැත්වෙන රටවල් සමූහයක් වෙයි. ඒ අග්නිදිග ආසියාව යැයි හැඳින්වෙන කලාපයේ ඇති ථෙරවාදී රටවල් ය. මියන්මාරය, තායිලන්තය පමණක් නොව කාම්බෝජයේ ද බක්මහ සංක්‍රාන්ති උළෙල පැවැත්වෙයි.

අප තේරුම් ගත යුත්තේ ඒ එසේ වන්නේ ඇයි ද යන්න මිස ඉංගිරිසින් හා ඔවුන් විසින් පුහුණුකරනු ලැබූ ඉතිහාසඥයන් ඊනියා පරයේෂණ ඔස්සේ ඉදිරිපත්කරන බොරු කතන්දර නො වෙයි. ථෙරවාද කලාපයට සංක්‍රාන්ති උත්සවය භාරතයේ හා ලංකාවේ ථෙරවාද මධ්‍යස්ථානයෙන් ලැබුණු එකක් විය යුතු ය. ඒ ලැබුණේ ලංකාවෙන් ද නැත්නම් භාරතයෙන් ද යන්න අප විසින් විසඳනු ලැබිය යුතු ගැටළුව වෙයි. සංක්‍රාන්තිය ශක වර්ෂය මුල්කරගෙන පැවැත්වෙන්නක් නිසා මේ උත්සවය ශකයන් විසින් පාලනය කෙරුණු ආන්ද්‍ර ප්‍රදේශයෙන් ලැබුණු උත්සවයක් ලෙස සැලකීම යෝග්‍ය වෙයි. ආන්ද්‍ර ප්‍රදේශය එක් කලෙක ථෙරවාදයේ මධ්‍යස්ථානයක් වූ බව අමතක නොකළ යුතු ය. මෙහි දී සඳහන්කළ යුත්තක් නම් ආන්ද්‍ර ප්‍රදේශය ථෙරවාදයේ මධ්‍යස්ථානයක් වුව ද අද තමිල්නාඩුව නමින් හැඳින්වෙන ප්‍රදේශය සමස්තයක් ලෙස ගත්කල එවැනි මධ්‍යස්ථානයක් නොවූ බව ය. අපට සිතාගත හැක්කේ ථෙරවාද සම්බන්ධතා ඔස්සේ සිංහලයන්ට ලැබුණු සංක්‍රාන්ති උත්සවය මෙරට දී සිංහල අවුරුදු උත්සවයක් බවට පත් වී ඇති බව ය. නෙනානගතය ආදිය ඇතුළත්කර නිර්මානය කෙරී ඇති සිංහල අවුරුද්ද සිංහලයන්ගෙ නිර්මානශීලීත්වයට සාක්ෂියකි.

© Prof. Nalin De Silva